සංචාරක රක්ෂණය යනු කුමක්ද?

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

1.

සංචාරක රක්ෂණය යනු කුමක්ද?

සංචාරක රක්ෂණය යනු සංචාරවලට අදාලව මුහුණ දීමට සිදුවන අනපේක්ෂිත අවදානම් ආවරණය කරන රක්ෂණ ක්‍රමයකි. මෙහිදී සංචාරය ඇතුලත ඇතිවන අවදානම්වලට මූල්‍යමය ආරක්ෂාවක් හිමිවේ.

දේශීය මෙන්ම විදේශීය සංචාර ආවරණය වන පරිදි රක්ෂණාවරණ ලබාගත හැකි අතර සංචාරක රක්ෂණය මගින් රක්ෂිතයාට සංචාරක කාලසීමාව තුළදී ඇතිවන අනතුරු, අනපේක්ෂිත වෛද්‍ය වියදම්, ගමන් බලපත්‍ර, ගමන් මලු හා භාණ්ඩ නැතිවීම නිසා සිදුවන මූල්‍යමය අලාභවලට එකඟ වූ මුදලක් දක්වා වන්දි මුදල් ලබාගත හැක.

2.

සංචාරක රක්ෂණයක් මිලදී ගත යුත්තේ ඇයි?

සමහර විදෙස් රටවලට සංචාරය කිරීම සඳහා වීසා ලබා ගැනීමේදී සංචාරක රක්ෂණයක් ලබා ගැනීම අනිවාර්ය වේ. එසේ අනිවාර්ය නොවුණද, ඔබ ව්‍යාපාර කටයුතු, අධ්‍යාපන කටයුතු, නිවාඩු ගතකිරීම් සඳහා විදෙස්ගත වීමේදී සංචාරක රක්ෂණාවරණයක් ලබා ගැනීම ඉතා වැදගත් වේ. ඒ මන්දයත්, බොහෝ විදෙස් රටවල් වලදී සිදුවන අනතුරකදී වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට හා සංචාරය අතරතුර සිදුවිය හැකි හානි ප්‍රතිපූරණය කරගැනීමට අධික පිරිවැයක් දැරීමට සිදුවන බැවිනි.

3.

සංචාරක රක්ෂණයෙන් මූලිකවම ආවරණය වන සිදුවීම් මොනවාද?

විවිධ රක්ෂණ සමාගම් මගින් නිකුත් කරන සංචාරක රක්ෂණාවරණ වලින් ආවරණය වන සිදුවීම්වලට ලැබෙන ප්‍රතිලාභ සැසඳීමේදී සුළු වෙනස්කම් තිබුණද, සම්මත සංචාරක රක්ෂණාවරණයකින් පහත සඳහන් සිදුවීම් ප්‍රතිපූරණය කෙරේ.

- සංචාරය අතරතුර සිදුවන හදිසි අනතුරු නිසා දැරීමට සිදුවන වෛද්‍ය වියදම්
- සංචාරය අතරතුර සිදුවන හදිසි මරණ, එනම් මෘත දේහ ආපසු ගෙන්වා ගැනීමට හෝ රට තුළදී භූමදානය කිරීමට අදාලව සිදුවන වියදම්
- ගමන් බලපත්‍ර නැතිවීම, ගමන් මලු සහ පෞද්ගලික වටිනා දෑ නැතිවීම තුළින් සිදුවන අලාභයන්
- ගුවන්ගමන් අවලංගු වීම හේතුවෙන් ඔබට දැරීමට සිදුවන අමතර වියදම්
- සංචාරය අතරතුර සිදුවන අනපේක්ෂිත සිදුවීම් එනම් ගුවන්යානා පැහැරගැනීම් වැනි දේ හේතුවෙන් ඔබට දැරීමට සිදුවන වියදම්

පහතින් දැක්වෙන සිදුවීම් ප්‍රතිපූරණය සාමාන්‍යයෙන් සංචාරක රක්ෂණ ඔප්පුවකින් ආවරණය නොවේ.

- රක්ෂණාවරණය ලබාගැනීමට පෙර තිබූ සෞඛ්‍ය ගැටලුවලට යන වියදම්
- අවදානම් සහිත ක්‍රීඩා හා ක්‍රියාකාරකම් කිරීම තුළින් සිදුවන හානි සඳහා දැරීමට සිදුවන වියදම්
- සියදිවි නසාගැනීම් හා මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවන හානි හේතුවෙන් වන වියදම්
- ගැබ් ගැනීම් හා දරු ප්‍රසූතියන් සහ ගබ්සා වීම් හා සම්බන්ධ වියදම්
- අහිතකර කාලගුණික බලපෑම් හේතුවෙන් සිදුවන වියදම්
- මානසික හෝ චිත්තවේගී ආබාධ හේතුවෙන් දැරීමට සිදුවන වියදම්
- සාමාන්‍ය දන්ත ප්‍රතිකාර සඳහා වැයවන වියදම්

4.

සංචාරක රක්ෂණාවරණයක් මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

- **සංචාරක කාලය (දින ගණන)** - ඔබ සංචාරය කරන දින ගණන ඔබගේ සංචාරක රක්ෂණයේ වාරික මුදල තීරණය කරන මූලික සාධකයක් වේ. ඔබ සංචාරය කරන්නේ සුළු දින ගණනකට පමණක් නම් වාරික මුදල අඩුවන අතර සංචාරයේ කාලය දීර්ඝ වන්නේ නම් සංචාරක රක්ෂණයේ වාරික මුදල වැඩිවෙනු ඇත. සංචාරක රක්ෂණ ඔප්පුවක් නිකුත් කරනුයේ නිශ්චිත සංචාරක කාලසීමාවකට පමණි. එම කාලසීමාව අවසානයේදී එය ස්වයංක්‍රීයව අවලංගු වේ. ඔබ රක්ෂණාවරණය දින 10කට පමණක් ලබාගෙන රක්ෂණයේ කාලසීමාව දීර්ඝ නොකර, පසුව දින 11 ක් දක්වා සංචාරය දීර්ඝ කරගතහොත්, 11 වන දිනයේදී මුහුණ දෙන අවදානම් වලට යන වියදම් එයින් ආවරණය නොවේ. එබැවින් ඔබගේ සංචාරක කාලසීමාව කොපමණද යන්න කල්තියා සැලසුම් කරගත යුතුය. කාලසීමාව දීර්ඝ කිරීමට සිදුවුවහොත්, රක්ෂණාවරණය කල් ඉකුත්වීමට පෙර දීර්ඝ කළ යුතුය.

“ සංචාරක රක්ෂණ ඔප්පුවක් නිකුත් කරනුයේ නිශ්චිත සංචාරක කාලසීමාවකට පමණි. එම කාලසීමාව අවසානයේදී එය ස්වයංක්‍රීයව අවලංගු වේ. ”

- **සංචාරය තුළ සිදුකිරීමට සැලසුම් කරන ක්‍රියාවන් -** ඔබට ගැලපෙන හා දැරිය හැකි සංචාරක රක්ෂණාවරණය තෝරා ගැනීමට නම්, ඔබ සංචාරය අතරතුර කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාකාරකම් පිළිබඳ සැලිකිලිමත් විය යුතුය. සංචාරය තුළ ඔබ ඉහළ අවදානම් සහිත ක්‍රීඩා හෝ වෙනත් එවැනි ක්‍රියාවන්වල නිරතවන්නේ නම් ඒ සඳහා වැඩි වාරික මුදලක් දරමින් අතිරේක රක්ෂණාවරණ ලබාගැනීමට සිදුවනු ඇත. එමෙන්ම එවැනි අවදානම් ක්‍රියාකාරකම් සඳහා රක්ෂණාවරණයේ යම් සීමාවන් තිබිය හැකිය.

- **වෛද්‍ය කොන්දේසි හා සෞඛ්‍යය -** සංචාරක රක්ෂණාවරණයක් තෝරාගැනීමේදී සෞඛ්‍යය හා වෛද්‍ය කොන්දේසි පිළිබඳ සැලිකිලිමත් විය යුතුය. ඇතැම් විට ඔබ සංචාරය කරන ස්ථාන වලින් නොයෙකුත් රෝග බෝවීමේ අවදානමක් තිබිය හැක. අනපේක්ෂිතව ඔබට එම රෝගාබාධ වැළඳුනහොත්, ඔබගේ රක්ෂණය තුළින් ඔබට රක්ෂණාවරණය ලැබෙනු ඇතැයි යන විශ්වාසයෙන් ගමන් කළද, ඇතැම්විට එවැනි රෝග ආවරණය කිරීම සඳහා සීමාවන් තිබීම හෝ ආවරණය නොවීමක් සිදුවිය හැක. එබැවින් ඔබගේ සංචාරක රක්ෂණාවරණයේ ඇති වෛද්‍ය කොන්දේසි පිළිබඳව ඉතා විමසිලිමත් ලෙස සලකා බැලිය යුතුය.

  එමෙන්ම සංචාරක රක්ෂණයක් ලබාගැනීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට අවශ්‍යද යන්න පිළිබඳ රක්ෂණ සමාගම හෝ රක්ෂණ තැරැව්කාර සමාගමෙන් විමසා දැනගතයුතු වේ. එමෙන්ම සංචාරක රක්ෂණාවරණයට අදාලව විදෙස් රටකදී ප්‍රතිකාර ලබාගැනීමට පෙර අදාල රක්ෂණ සමාගමට දැනුම් දීම හෝ අනුමැතිය ලබා ගත යුතුද යන්න දැනගැනීම ඉතා වැදගත් වේ.

- **ඔබගේ සියලු ගමනාන්ත ආවරණය වන බව සහතික කරගන්න -** එක් රටකට වඩා සංචාරය කිරීමට බලාපොරොත්තුවන්නේ නම් අදාල රටවල් කිහිපයම ඔබගේ රක්ෂණාවරණයෙන් ආවරණය කරන්නේද යන්න පරීක්ෂා කරගත යුතුය.

- **ඔබගේ බඩුබාහිරාදිය සියල්ල ආවරණය වන බව සහතික කරගන්න -** සංචාරය සඳහා ඔබ මිල අධික කැමරා උපකරණ, ස්වර්ණාභරණ යනාදිය රැගෙන යන්නේ නම් ඒ පිළිබඳව අදාල රක්ෂණ ආයතනය දැනුවත් කළ යුතුය. එසේ නැතහොත් සමහර අවස්ථාවන්හිදී එවැනි වටිනා භාණ්ඩ ආවරණය නොවී තිබිය හැකිය. එවැනි අවස්ථාවන්වලදී ඔබට අමතර මුදලක් ගෙවා එවැනි වටිනා භාණ්ඩ සඳහාද ආවරණය ලබාගත හැකි වේ.

5.

සංචාරක රක්ෂණයේදී ඔබ කළ යුතු හා නොකළ යුතු දෑ මොනවාද?

කළ යුතු දෑ :

- වීසා බලපත්‍රය හා වෙනත් අවශ්‍ය ලියකියවිලි සඳහා මෙන්ම ඔබගේ සංචාරක රක්ෂණයද කල්තියා සැලසුම් කළ යුතුය.
- සෞඛ්‍ය තත්වය සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීමට වුවහොත්, එම පරීක්ෂණ සඳහා වෛද්‍ය වාර්තා ලබාගැනීමෙන් පසුව යෝජනා පත්‍රය සම්පූර්ණයෙන්ම හා සත්‍ය ලෙස පුරවා ගැනීමට සැලකිලිමත් වන්න.
- කල්තියා සංචාරක කාලය තීරණය කරගෙන එම සම්පූර්ණ කාලය සඳහාම රක්ෂණාවරණය ලබාගන්න.
- ඔබ සංචාරක කාලය කෙටි කිරීමට අදහස් කළහොත්, එයට අදාල මුදල් ඔබට ආපසු ලබාගැනීමට හිමිකම් ඇත්දැයි පරීක්ෂා කරගන්න.
- සංචාරක රක්ෂණ ඔප්පුවේ සඳහන් ආවරණය නොකරන සිදුවීම් / හානි හොඳින් කියවා අවබෝධ කර ගන්න.

නොකළ යුතු දෑ :

- සංචාරක රක්ෂණාවරණය ලබාගැනීම අවසානය දක්වාම කල් නොදමන්න.
- ඔබ යමෙකු නිර්දේශ කරන රක්ෂණාවරණයම එකවර නොගෙන, හැකිතාක් තොරතුරු රැස්කරගෙන ඔබට සුදුසුම රක්ෂණාවරණය කුමක්ද යන්න තේරුම් ගෙන එය මිලදී ගන්න.
- මිල අනුව රක්ෂණාවරණය ලබාගැනීමට නොපෙළඹිය යුතු අතර එමගින් ඔබට අවශ්‍යම දෑ ආවරණය නොවී යනු ඇත.

6. සංචාරක රක්ෂණාවරණයට අදාලව හිමිකම් පෑම

ඔබගේ සංචාරක රක්ෂණාවරණයට අදාල හිමිකම් පෑම විදේශ රටකදී සිදුකරන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුවත්වීම ඉතා වැදගත් වේ. එමෙන්ම ඒ සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග හා ලබා දිය යුතු ලියවිලි මොනවාද යන්න විදෙස්ගත වීමට පෙර දැනුවත් වීම වැදගත් වේ. බොහෝ අවස්ථාවලදී විදෙස් රටකදී හිමිකම්පෑමක් හෝ ඒ සම්බන්ධ කටයුතු සඳහා අදාල සේවා ලබාගැනීම සඳහා ඔබගේ රක්ෂණ සමාගම විසින් තෝරාගත් නියෝජිත ආයතනයක් නම් කෙරේ. මේ සියල්ල ඔබගේ සංචාරක රක්ෂණ ඔප්පුවේ සඳහන් වන අතර වැඩිදුර තොරතුරු සඳහා ඔබගේ රක්ෂණ සමාගමෙන් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමෙන් විමසා දැනගැනීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමු කරන ආකාරය

7.

රක්ෂණ හිමිකමක් පිළිබඳව පැමිණිල්ලක් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ බලතල ප්‍රකාරව රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා පැමිණිලි විභාග කිරීම සිදු කරන අතර, ඒ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග පහත පරිදි වේ:

පළමුව ඔබගේ රක්ෂණ සමාගම වෙත පැමිණිල්ල යොමුකරන්න. රක්ෂණ සමාගමට පැමිණිල්ල යොමු කරන ආකාරය ගැන දැනගැනීම සඳහා https://ircsl.gov.lk/list-of-insurance-companies/ වෙත පිවිසෙන්න. සමාගම සාධාරණ කාලසීමාවක් ඇතුළත එය නිරාකරණය කර, ඒ සඳහා ඔබට පිළිතුරක් ලබා දිය යුතුය.

ඔබට රක්ෂණ සමාගමෙන් සාධාරණ කාලසීමාවක් තුල පිළිතුරක් නොලැබුනහොත් හෝ පැමිණිල්ල නිරාකරණය කිරීම සම්බන්ධයෙන් ඔබ සෑහීමකටපත් නොවන්නේ නම්, ඔබගේ පැමිණිල්ල ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව හෝ රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කල හැකිය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකි ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා https://ircsl.gov.lk/policyholder-complaints/ වෙත පිවිසෙන්න.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවට මාර්ගෝපදේශයක් වශයෙන් සංචාරක රක්ෂණාවරණයක් මිලදී ගැනීමේදී සැලකිය යුතු කරුණු පිළිබඳ මෙම අත්පොත නිකුත් කර ඇති අතර මෙහි ඒ පිළිබඳ සාමාන්‍ය තොරතුරු පමණක් අඩංගු වේ. මෙහි දක්වා ඇති කිසිදු තොරතුරක් රක්ෂණ ඔප්පුවක නියමයන් සහ කොන්දේසි ප්‍රතිස්ථාපනය හෝ ප්‍රතික්ෂේප නොකරයි. රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු සඳහා හෝ වෙනත් අමතර තොරතුරු සඳහා රක්ෂණ සමාගම, රක්ෂණ තැරැව්කාර සමාගම හෝ රක්ෂණ නියෝජිතයා අමතා ලබා ගත හැක.

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වන මහළ, නැගෙනහිර කුළුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථනය - 0112 2396184-9 I ෆැක්ස් - 0112 2396190
විද්‍යුත් තැපෑල - mder@ircsl.gov.lk

www.ircsl.gov.lk

https://www.facebook.com/Ircslofficialpage/

https://www.linkedin.com/company/insurance-regulatory-commission-of-sri-lanka/

https://www.youtube.com/channel/UCuM9RLGQTi7B2MM7PL7jfiA

බැඳියාව හා නොපිළිගැනීම
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම අත්පොත මුද්‍රණය කරන ලද අතර කිසිදු නීතී උපදෙස් සැපයීමේ ආදේශකයක් වශයෙන් මෙය උපයෝගී කරගත නොහැක.